රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි : 04/2000

මගේ අංකය : ඒආර්/3/2/6
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2000.11.16 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ඉලෙක්ට්‍රොනික තැපැල (ඊ- මේල්) මගින් පමණක් යැවීම

රජයේ කාර්යාලවල සන්නිවේන කටයුතු සඳහා ඉලෙක්ට්‍රොනික තැපැල යොදා ගැනීමෙන් පහත දැක්වෙන අරමුණු ඉටු කරගැනීමට අදහස් කෙරේ.

1. රාජ්‍ය අංශයේ සන්නිවේදනය ක්‍රියාවලිය වේගවත් කිරීම.
2. රාජකාරි කටයුතු සඳහා පරිගණක භාවිතය ඉහල නැංවීම.
3. ලිපි මුද්‍රණය සඳහා වැයවන වියදම අඩුකිරීම.
4. එමගින් ඵලදායිතාව ඉහල නැංවීම.

මෙම සන්නිවේදන මාධ්‍ය භාවිතයට ගැනීම තහවුරු කිරීමේ අදහසින් 2001.01.01 දින සිට මෙම අමාත්‍යාංශය විසින් නිකුත් කරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා අනෙකුත් ලිපි ගණුදෙනු ඊ-මේල් මගින් පමණක් දැනට එම පහසුකම් ඇති ආයතන වලට නිකුත් කරනු ලැබේ. එහෙයින් මේ සඳහා භාවිතා කිරීම පිණිස ඔබ ආයතනය හා ඔබ ආයතනය යටතේ ඇති අනෙකුත් රජයේ ආයතන භාවිතා කරන ඉලෙක්ට්‍රොනික තැපැල් ලිපිනයන් 2000.11.30 දිනට පෙර පහත දැක්වෙන වගුව පරිදි මා වෙත දන්වන ලෙස කාරුණිකව දන්වමි. (මෙම තොරතුරු ඊ-මේල් මගින් pubadcom@sltnet.lk ලිපිනයටද එවිය හැක).

ඊ-මේල් ලිපිනයන්

| ආයතනයේ නම | ඊ-මේල් පහසුකම් තිබේද ? | ඊ-මේල් ලිපිනය |
|---|---|---|
| ප්‍රධාන ආයතනය | | |
| යටතේ ඇති අනෙක් ආයතන * | | |
| 1. | | |
| 2 | | |
| 3 | | |

(* ඊ-මේල් පහසුකම් නැති වුවද සියළුම උප ආයතන මෙහි දක්වන්න).

02. ඔබ ආයතනය හෝ ඔබ ආයතනය යටතේ ඇති රජයේ අනෙකුත් ආයතන සතුව ඊ-මේල් පහසුකම් නොමැත්තේ නම් එම පහසුකම් වහාම ලබා ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය. ඒ අනුව කටයුතු කොට ඊ-මේල් පහසුකම් ලබා ගත් වහාම නව ඊ-මේල් ලිපිනයන්ද දැන්වීමට පියවර ගත යුතුය.

03. ඊ-මේල් පහසුකම් නොමැති කාර්යාලවලට දැනට අනුගමනය කරන ප්‍රතිපත්තියම අනුගමනය කරමින් චක්‍රලේඛ හා ලිපි මුද්‍රණය කර තැපෑලෙන් එවනු ලැබේ. නමුත් ඊ-මේල් පහසුකම් ඇති ආයතනවලට ඊ-මේල් මගින් යැවීමෙන් කාලයත්, වියදමත් විශාල වශයෙන් අඩුකිරීමේ අදහසක් ඇත. එනිසා හැකි ඉක්මණින් ඊ-මේල් පහසුකම් ලබාගන්නා ආයතන ඒ බැව් මා වෙත දැන්වීමට සටහන් කරගන්න.

04. මේ සම්බන්ධයෙන් යම් දුෂ්කරතාවයක් ඇතොත් එය මා වෙත වහාම දන්වන්නේ නම් මැනවි.

එම්.එන්. ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය